**GMOA**

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

GMOA/SH/2013/0178
30/12/2013

වෛද්‍ය නිහාල් ජයතිලක
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 10.

මහත්මයාණෙනි,

2013/12/30 වන දින ලංකාදිප පුවත්පතේ පලවු "දුම්කොළ - දුම්වැටිවලට වඩා කිරි පිටි භයානකයි" නම් වූ මාධ්‍ය නිවේදනය සම්බන්ධවයි.

ඉහත පුවත්පතේ පලවු මාධ්‍ය වාර්තාවට අනුව දුම්කොළ වලට වඩා වැඩි විසක් කිරි පිටි වල ඇති බවට මතබේදයට තුඩු දිය හැකි තොරතුරු මත පදනම් වූ ප්‍රවෘත්ති නිවේදනයක් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංසදයේ ලේකම් යැයි සඳහන් වෛද්‍ය නිශාන්ත ප්‍රේමරත්න යන අයකු විසින් නිකුත් කර ඇත.

මේ පිලිබඳ සියලුම මාධ්‍ය ආයතන වලින් අප සංගමයෙන් විමසීම් කර ඇති අතර අප දන්නා පරිදි ඉහත ආකාරයේ රජයේ වෛද්‍ය නිලධාරි සංසදය ලියාපදිංචි කරන ලද වෘත්තිය සමිතියක් නොවේ. එහි ලේකම් ලෙස වෛද්‍ය කේ කේ එන් ප්‍රේමරත්න මහතා කටයුතු කරන බව මේ සමඟ අමුණා ඇති ලිපියෙන් පැහැදිලි වේ. රාජ්‍ය සේවකයෙකු ලෙස ඉහත වෛද්‍යවරයා ජනතාව නොමග යවන ආකාරයේ හා දුම්වැටි වලට පක්ෂග්‍රාහි අන්දමේ සිදුකර ඇති යථෝක්ත ප්‍රකාශය නිසා රාජ්‍ය සේවයේ සමස්ථ වෛද්‍යවරුන් සිය විමතිය අප වෙත පළකර ඇත. ඒ අනුව සමස්ත රාජ්‍ය සේවයම අපකීර්තියට හා අපහසුතාවයට පත්වන 'ආකාරයට ප්‍රකාශ නිකුත් කරන ලද මෙම පුද්ගලයා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මට්ටමේ විනය ක්‍රියාමාර්ගයක් නොපමාව ගන්නා ලෙස අප ඔබගෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

පිටපත් :
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්
අධ්‍යක්ෂ - ජාතික රෝහල කොළඹ
ප්‍රධාන කතෘ - ලංකාදිප පුවත්පත
ලේකම් - රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සියළු ශාඛා සංගම්